**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහනේ අදියර - 3 - 2021**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහනේ - අදියර 3 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කොළඹ මහ නගර සභාව සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 අගෝස්තු 11 දින එළඹි අංක 3348 /3349 දරන ව්‍යාපෘති ගිවිසුමේ 2.10 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

---

ණය ගිවිසුම්වලට අනුව එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කිලෝමීටර 29.4ක මලාපවහන ජාල එලීම සහ පොම්පාගාර 3ක් ඉදිකිරීම ඇතුළුව දකුණු පෝෂක ප්‍රදේශයේ අපජල පවිත්‍රාගාර පුනරුත්ථාපනය සහ පුළුල් කිරීම සහ ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම හා සේවා සපයන්නන්ගේ ධාරිතා වර්ධනය වැඩසටහනේ අරමුණ වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 16,401.76කට සමාන එජඩො මිලියන 112.83ක් වූ අතර ඉන් රු.මිලියන 13,471.16කට සමාන එජඩො මිලියන 92.29ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 2,930.60කට සමාන එජඩො මිලියන 20.54ක් ශ්‍රී ලංකා රජය මූල්‍යනය කිරීමට අපේක්ෂා කර තිබුණි. වැඩසටහන එහි කටයුතු 2016 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, වැඩසටහනේ කාලය 2022 ඔක්තෝබර් 24 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

------

වැඩසටහනේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

## 2.1 නීති,රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම

--------------------------------------------------

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | සමාලෝචන කමිටු මාස 02කට වරක් පැවැත්විය යුතුවේ. කෙසේවෙතත්, 2021 | සෞඛ්‍ය අංශ මගින් ක්‍රියාත්මක කරන ලද රෙගුලාසිවලට | විකල්පයක් ලෙස මාර්ගගත රැස්වීම් පැවැත්වීම කළ |

| | | |
|---|---|---|
| වර්ෂය තුළදී සමාලෝචන කමිටු රැස්වීම් හතරක් පමණක් පවත්වා තිබුණි. | අනුගතවෙමින් රැස්වීමක් සංවිධානය කිරීම අසීරුවිය. | යුතුව තිබුණි. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| **සංරචකය** | **2021 දෙසැම්බර් 31 දිනට** | | **විගණන ගැටලුව** | **ප්‍රමාදය සඳහා හේතු** |
|---|---|---|---|---|
| | **අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය** | **අත්කරගත් කාර්යසාධනය ප්‍රතිශතය** | | |
| (අ) කිරුළපන පෝෂක ප්‍රදේශය සඳහා නව ගුරුත්වාකර්ෂණ මලාපවහන ජාලයක්, පීඩන මධ්‍යස්ථාන සහ පොම්පාගාර ඉදිකිරීම | 100 | 67 | කොන්ත්‍රාත්තුව 2017 මැයි 18 දින ආරම්භ කර 2020 මැයි 14 දින නිමකිරීමට සැලසුම් කර තිබුණද කොන්ත්‍රාත්තුව 2022 ජුලි 30 දක්වා දීර්ඝ කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්තුව වර්ෂ දෙකක් පමණ ප්‍රමාදවී තිබුණු බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී භෞතික ප්‍රගතිය, අවශ්‍ය සම්පත්වල අයථා පරිහරණය, දුර්වල සැලසුම්කරණය සහ නිසි අධීක්ෂණයක් නොමැතිවීම සහ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ තීරණ ගැනීමේ ප්‍රමාදයන්. |
| (ආ)වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම | 100 | 5 | වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2017 ජුනි 21 දින ආරම්භ කර 2019 දෙසැම්බර් 14 දින නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, මාස 30ක ප්‍රමදයකින් පසුව 2020 දෙසැම්බර් 18 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | (i) 2021 ඔක්තෝබර් 21 දින කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් අත්සන් කර ඇති අතර ගිවිසුම සහ ප්‍රතිග්‍රහණ ලිපිය අනුව මාස 3ක් ඇතුළත ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම කොන්ත්‍රාත්කරු වෙත භාරදීමට සිදුවේ. කෙසේවෙතත්, එය 2021 දෙසැම්බර් 31 දක්වා භාරදී නොතිබුණි.<br><br>(ii)මෙම අරමුණ සඳහා කොළඹ මහ නගර සභාවේ රුඩ්ා ක්‍රීඩාංගනය තෝරාගෙන තිබුණු අතර 2009 සැප්තැම්බර් 28 දිනැති අංක 543 දරණ යෝජනාව මගින් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | අනුමැතිය ලබා දී තිබුණි. කොළඹ මහ නගර සභාව විසින් 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුට ඉඩම භාරදීමට පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) කිරුල - නාරාහේන්පිට ප්‍රදේශය සඳහා මලාපවහන පහසුකම් සැපයීම | 100 | පූර්ව කොන්ත්‍රාත් අදියරෙන් 75 | කොන්ත්‍රාත්තුව 2017 ඔක්තෝබර් 23 වන දින ආරම්භ කර සහ 2020 අප්‍රේල් 10 දින නිමකිරීමට සැලසුම් කර තිබුණද කොන්ත්‍රාත්තුව 2021 දෙසැම්බර් 31 දක්වා ප්‍රදානය කර නොතිබුණි. | (i) නාගරික සංවර්ධන අධිකාරිය වෙත වසර 30ක් සඳහා ඉඩමේ මුළු ලීසිං වටිනාකම ගෙවා තිබුණද 2022 දෙසැම්බර් 28 දිනට නාගරික සංවර්ධන අධිකාරිය සමග විධිමත් ලීසිං ගිවිසුමක් එළඹ නොතිබුණි.<br>(ii) දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලීසිං කරන ලද ඉඩමක ජීවත්වන පවුල් 06ක් නැවත පදිංචි කිරීම සඳහා රු.30,060,000ක් වැයකර තිබුණද, 2021 දෙසැම්බර් 31 දක්වා එම පවුල් ඉඩමින් ඉවත්කර නොතිබුණි. |
| (ඈ) දකුණු පෝෂක ප්‍රදේශයේ දෝෂ සහිත මලාපවහන අළුත්වැඩියාව සහ අඩු ධාරිතාවයෙන් යුත් මලාපවහන ඉහල නැංවීමේ සහ ක්‍රියාත්මක කිරීම | 100 | පූර්ව කොන්ත්‍රාත් අදියරෙන් 75 | කොන්ත්‍රාත්තුව 2019 නොවැම්බර් 01 වන දින ආරම්භ කර සහ 2021 දෙසැම්බර් 05 දින නිමකිරීමට සැලසුම් කර තිබුණද කොන්ත්‍රාත්තුව 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රදානය කර නොතිබුණි. | ඉහල මට්මේදී අඩු ප්‍රමුඛතාවයක් ලබා දීම සහ කොන්ත්‍රාත්තුවේ විෂයපථය පිළිබඳව අවසන් නිගමනයකට නොඑළඹීම. |
| (ඉ) මූල්‍ය කළමනාකරණය සහ ගිණුම්කරණ පද්ධතිය | 100 | 100 | ජලාපවහන අංශයට හඳුන්වා දෙන ලද රු.3,159,879 වටිනා මූල්‍ය කළමනාකරණ සහ ගිණුම්කරණ පද්ධතිය 2017 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතුණි. | (i) මෙම පැකේජය ක්‍රියාත්මක කිරීමේ වගකීම නිලධාරියෙකු වෙත විධිමත්ව පවරා නොතිබුණු අතර ස්ථාපනය කරන ලද පරිගණක පැකේජය |

පිළිබද තොරතුරු විගණනය සදහා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) මෙම පැකේජය මිළදී ගැනීම සදහා වන තාක්ෂණික ඇගයීම් කමිටුව පැකේජය ස්ථාපනයෙන් පසුව වර්ෂ 3ක කාලයක් සදහා වගකීම සහ නඩත්තු ගිවිසුමකට එලඹීමට නිර්දේශ කර තිබුණි. කෙසේවෙතත්, ඒ සදහා අනුකූලවීම පිළිබද තහවුරු කර ගැනීමට විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | |
|---|---|
| **කළමනාකරණයේ ප්‍රතිචාරය** | කොන්ත්‍රාත්කරුට වැඩබිම භාරදීමේ ප්‍රමාදය සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය ප්‍රධාන වශයෙන් කොන්ත්‍රාත් කාලය තුළ කොන්ත්‍රාත්තුව නිමකිරීම ප්‍රමාදවීමට හේතුවිය. |
| **විගණකගේ නිර්දේශය** | ව්‍යාපෘතියේ කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීමට අවශ්‍ය වේ. |

## 3.2 ඌනඋපයෝජිත සම්පත්

| **විගණන ගැටලුව** | **කළමනාකරණයේ ප්‍රතිචාර** | **විගණකගේ නිර්දේශ** |
|---|---|---|
| මහා භාණ්ඩාගාරය 2017 මැයි 15 දින සිට 2020 නොවැම්බර් 15 දක්වා OCR ණය මුදලේ ලබා නොගත් ණය ශේෂය මත රු. මිලියන 151ක් බැදීම් ගාස්තු ලෙස ගෙවා තිබුණි. | මුල් ණය කාලසීමාව තුළ ව්‍යාපෘතිය නිමකළද බැදීම් ගාස්තු පිරිවැය නොවැළැක්විය වේ. | නිසි ව්‍යාපෘති සැලසුම්කරණයක් මගින් මෙම පිරිවැය අවම කරගත යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගැටලු

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | ණය ගිවිසුමට අනුව වැඩසටහන 2016 නොවැම්බර් 03 දින ආරම්භ කර 2020 දෙසැම්බර් 31 දින නිමකිරීමට සැලසුම්කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් නිමකිරීමේ දිනය 2022 ඔක්තෝබර් 24 දක්වා දීර්ඝකර ඇත. | ව්‍යාපෘතියේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘතිය දීර්ඝකිරීමට සිදුවිය. | ව්‍යාපෘතියේ කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීමට අවශ්‍ය වේ. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 වන විට වැඩසටහනේ නිම කිරීමේ දිනය සිට මාස 12ක් ගතවී තිබුණද, 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපත්ති සහය කණ්ඩායම් වෙත රු.මිලියන 41.2ක් ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ අනුමත කාර්ය මණ්ඩලයේ පත්කිරීම් මත ප්‍රතිපත්ති සහය කන්ඩායම් වෙත ගෙවීම් කර ඇත. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාකාරීව දායක විය යුතු අතර ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම් කළ යුතුය. |